(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 187.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2026 ඔක්තෝබර් 08 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

787/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මීගමුව ඩිපෝව සතුව මේ වනවිට ධාවනයට සුදුසු මට්ටමේ පවතින බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට එම ඩිපෝව මඟින් දෛනිකව ධාවනය කරනු ලබන බස් රථ සංඛ්‍යාව කොපමණද;

(iii) එම ඩිපෝවේ පවතින සේවක පුරප්පාඩු කවරේද;

(iv) එම ඩිපෝව 2015 වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂිකව ලැබූ ලාභ/අලාභ කවරේද;

(v) මීගමුව නගරයේ සිට දුරගමන් සේවා ආරම්භ කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

911/2025

ගරු මුජිබුර් රහුමාන් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, රේගු පරිගණක පද්ධතිය සමඟ සම්බන්ධවීමට ප්‍රථම අනීතික වාහන ලියාපදිංචි කිරීම සම්බන්ධව විගණකාධිපතිවරයා ඉදිරිපත් කළ කරුණු කවරේද;

(ii) ඒ අනුව, එම අක්‍රමිකතාවලට දායකවී ඇති නිලධාරීන්ගේ නම් සහ තනතුරු නාම කවරේද;

(iii) එම සිදුවීම තුළින් රජයට අහිමිවී ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එම සිදුවීම සම්බන්ධව අමාත්‍යාංශ මට්ටමින් ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1040/2025

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීමට හිඟව ඇති පෞද්ගලික ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතනවල නම් කවරේද;

(iii) එම ගෙවීමට ඇති හිඟ මුදල් ප්‍රමාණය ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම හිඟ මුදල් අයකර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1078/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනයේ සහ උතුරු පළාතේ අනෙකුත් දිස්ත්‍රික්කවල ඇති පාරිසරික, ඓතිහාසික සහ සංස්කෘතික ආකර්ෂණයන් හඳුනාගෙන ඒවා ප්‍රවර්ධනය කිරීමට ගනු ලබන පියවර කවරේද;

(ii) දේශීය සංස්කෘතිය, ප්‍රජාවන් සහ පරිසර පද්ධතීන් ආරක්ෂා කර ගනිමින් මෙම ප්‍රදේශය සංචාරක උපාය මාර්ගයට ඒකාබද්ධ කිරීම සඳහා කලාපීය වශයෙන් විශේෂිත සැලසුම් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දේශීය පාරිසරික සංචාරක ස්ථාන වෙත ප්‍රවේශය වැඩිදියුණු කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(ii) නවාතැන් සහ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අමාත්‍යාංශය, අදාළ පාර්ශ්වකරුවන් සමඟ හවුල්කාරිත්වයෙන් කටයුතු කර තිබේද;

(iii) දේශීය ප්‍රජාවන්, විශේෂයෙන්ම තරුණ තරුණියන් සහ කාන්තාවන් පුහුණු කිරීම සහ සේවයේ යෙදවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(iv) උතුරු පළාතේ ගැටුම්වලින් බලපෑමට ලක්වූ දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කිරීම සඳහා පාරිසරික ආරක්ෂණ විධිවිධාන ඇතුළත් පුළුල් පරිසර සංචාරක ප්‍රතිපත්තියක් පිළිබඳව සලකා බලනු ලබන්නේද;

(v) යාපනය ගෝලීය සහ දේශීය වශයෙන් ප්‍රවලිත කිරීම සඳහා සහ පරිසරයට සහ දේශීය ජීවනෝපායන්ට සංචාරක ව්‍යාපාරයේ දිගු කාලීන බලපෑම් නිරීක්ෂණය කිරීම සඳහා වන යාන්ත්‍රණයන් කවරේද?

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1338/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි කඩොලාන වනාන්තර සංඛ්‍යාව කොපමණද;

(ii) එම කඩොලාන වනාන්තරවල නම් කවරේද;

(iii) එම කඩොලාන වනාන්තර අතරින් මේ වනවිට රක්ෂිත බවට පත් කර ඇති වනාන්තර සංඛ්‍යාව කොපමණද;

(iv) එම වනාන්තරවල නම් කවරේද;

(v) විවිධ ක්‍රියාකාරකම් හේතුවෙන් විනාශ වීමේ තර්ජනයට ලක්ව ඇති කඩොලාන වනාන්තර සංඛ්‍යාව කොපමණද;

(vi) එලෙස තර්ජනයට ලක්ව ඇති කඩොලාන වනාන්තරවල නම් කවරේද;

(vii) කඩොලාන පරිසර පද්ධතිය අනාගත පරම්පරාව උදෙසා ආරක්ෂා කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1380/2025

ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ක්‍රියාත්මක රජයේ විශ්වවිද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම විශ්වවිද්‍යාලවල නම් කවරේද;

(iii) විශ්වවිද්‍යාලවල මේ වනවිට ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් විශ්වවිද්‍යාලය මඟින් නේවාසික පහසුකම් සපයා ඇති ශිෂ්‍ය සංඛ්‍යාව, සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) නේවාසික පහසුකම් පිළිබඳ උග්‍ර හිඟයක් පවතින විශ්වවිද්‍යාල කවරේද;

(vi) නේවාසික පහසුකම් පිළිබඳ ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1530/2025

ගරු තුරෛරාසා රවිකරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කලාප මට්ටමින් තොරතුරු තාක්ෂණ දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථාන (ITDLH) පිහිටුවීමේ අරමුණු සහ අපේක්ෂිත ප්‍රතිලාභ කවරේද;

(ii) උතුරු සහ නැගෙනහිර පළාත්වල ඇතැම් අධ්‍යාපන කලාපවල එම මධ්‍යස්ථාන මෙතෙක් ස්ථාපිත කර නොමැති බව දන්නේද;

(iii) එසේ නම්, මෙතෙක් එම මධ්‍යස්ථාන ස්ථාපිත කර නොමැති කලාප කවරේද;

(iv) එම කලාපවල මධ්‍යස්ථාන ස්ථාපිත නොකිරීමට හේතු කවරේද;

(v) මෙතෙක් මධ්‍යස්ථාන ස්ථාපිත කර නොමැති සියලුම අධ්‍යාපන කලාපවල ඒවා ස්ථාපිත කිරීම සඳහා කාල වකවානු සහිත සැලැස්මක් සකස් කර තිබේ නම්, එය ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

(vi) තාක්ෂණය පදනම් කරගත් දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථාන ස්ථාපිත කර නොමැති කලාපවල සමානාත්මතාවය තහවුරු කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1835/2026

ගරු චානක මාදුගොඩ මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්තමාන රජයේ ප්‍රතිපත්තිය අනුව 'අධ්‍යාපන සභාව' පිහිටුවීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, එම ආයතනයේ සංවිධාන ව්‍යුහය කවරේද;

(iii) ගුරු-විදුහල්පති වැටුප් විෂමතා විසඳීම සඳහා වන 'සුබෝධිනී වාර්තාව' ක්‍රියාත්මක කිරීමේදී නව ආයතනයක අවශ්‍යතාවය ඇති වන්නේ කවර ආකාරයකින්ද;

(iv) මෙම ආයතනය පිහිටුවා අවසන් කිරීමට නිශ්චිත කාල රාමුවක් තිබේද;

(v) එම ආයතනය මඟින් ගුරුවරුන්ගේ වෘත්තීය තත්ත්වය ඉහළ නැංවීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1951/2026

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ තේ නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතියේ සිදුව ඇතැයි පැවසෙන මූල්‍ය වංචාව සම්බන්ධයෙන්වූ විමර්ශන වාර්තාව අමාත්‍යාංශය විසින් පිළිගෙන තිබේද;

(ii) එම මහජන මුදල අදාළ පුද්ගලයන්ගේ පෞද්ගලික දේපළවලින් අයකර ගැනීම සඳහා ගෙන ඇති හෝ ගැනීමට නියමිත ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම සිද්ධිය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කර තිබේද;

(iv) සිද්ධියට සම්බන්ධ පුද්ගලයන් වෙනත් සමුපකාර සමිතිවල තනතුරු දැරීම වැළැක්වීම සඳහා ගෙන ඇති හෝ ගැනීමට නියමිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

2280/2026

ගරු එම්. එස්. උදුමාලෙබ්බෙ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, ගල්ඔය ව්‍යාපාරය යටතේ ඇති සේනානායක සමුද්‍රයේ වර්තමානයේ රඳවාගෙන ඇති ජල ප්‍රමාණය අක්කර අඩිවලින් කොපමණද;

(ii) 1992 වර්ෂයේ සිට සේනානායක සමුද්‍රයේ ප්‍රධාන බැම්ම, සොරොව් කුළුණ, සොරොව් බැරලය, ජලය නිකුත් කිරීමේ පද්ධතිය සහ පිටවාන් පද්ධතිය සම්බන්ධ ඉරි තැලීම් ඇතුළු තාක්ෂණික ගැටලු හඳුනාගෙන ඇති අතර, එම තත්ත්වය මේ වනවිට තීව්‍ර වී ඇති බැවින් ජලාශයේ තිරසරභාවය සහ දිගු කාලීන ආරක්ෂාව සම්බන්ධයෙන් අවදානම් තත්ත්වයක් මතුවී ඇති බව දන්නේද;

(iii) කෘෂි පවුල් 170,000කට පමණ වාරි පහසුකම් සලසමින් දිස්ත්‍රික්කයේ කෘෂි ආර්ථිකයේ ප්‍රධාන මූලාශ්‍රයක් බවට පත්ව ඇති මෙම ජලාශ පද්ධතියේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා පුළුල් අධ්‍යයනයක් සහ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— රණවිරු සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව (2023),— 1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරිය පනතේ 15 වගන්තිය යටතේ 2025.07.11 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රණවිරු සේවා අධිකාරියේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.11 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.11.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*7.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2021),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2023.08.09 දින ඉදිරිපත් කරන ලද, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*8.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— බී සී සී ලංකා ලිමිටඩ් සමාගමේ වාර්ෂික වාර්තාව (2021/2022),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.07.24 දින ඉදිරිපත් කරන ලද, 2022.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් බී සී සී ලංකා ලිමිටඩ් සමාගමේ 2021/2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*9.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ජාතික ලුණු සමාගමේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් (2021/2022),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.07.24 දින ඉදිරිපත් කරන ලද, 2022.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ලුණු සමාගමේ 2021/2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*10.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2022),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2024.08.21 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*11.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ වාර්ෂික වාර්තාව (2022),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2024.03.20 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*12.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— බී සී සී ලංකා ලිමිටඩ් සමාගමේ වාර්ෂික වාර්තාව (2022/2023),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.06.03 දින ඉදිරිපත් කරන ලද, 2023.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් බී සී සී ලංකා ලිමිටඩ් සමාගමේ 2022/2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*13.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ජාතික ලුණු සමාගමේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් (2022/2023),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.07.24 දින ඉදිරිපත් කරන ලද, 2023.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ලුණු සමාගමේ 2022/2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*14.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2023),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.05.20 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*15.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ වාර්ෂික වාර්තාව (2023),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.03.05 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*16.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ වාර්ෂික වාර්තාව (2023),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.03.14 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*17.

කම්කරු අමාත්‍යතුමා,— ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව (2022),— 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත යටතේ 2024.02.20 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.07.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.07.22 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*18.

කම්කරු අමාත්‍යතුමා,— ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනයේ වාර්ෂික වාර්තාව (2022),— 2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනය පනතේ 18 වගන්තිය යටතේ 2024.06.04 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.07.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.07.22 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*19.

වැව්ලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2015),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2023.08.23 දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2015 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 සහ 2026.02.05 යන දිනයන්හි දී සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*20.

වැව්ලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2016),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2024.03.06 දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.24 සහ 2026.02.05 යන දිනයන්හි දී සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*21.

වැව්ලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2017),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2024.03.06 දින ඉදිරිපත් කරන ලද, 2017.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.24 සහ 2026.02.05 යන දිනයන්හි දී සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*22.

වැව්ලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2018),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2024.03.06 දින ඉදිරිපත් කරන ලද, 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.24 සහ 2026.02.05 යන දිනයන්හි දී සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*23.

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*24.

ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*25.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබන ලද ප්‍රශ්නය. (2025 සැප්තැම්බර් 24) [1].

*26.

විදුලිසංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*27.

මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*28.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— “2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

29.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

30.

ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

31.

ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

32.

කෝදාගොඩ ගුණරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1.

2166/2026

ගරු තුරෙරෙරාසා රවිකරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) (i) 'දිට්වා' සුළි කුණාටුවෙන් හානියට පත් රජයේ පාසල් සංඛ්‍යාව;

(ii) එම පාසල්වලට සිදුවූ හානියේ ස්වභාවය සහ ඇස්තමේන්තුගත හානිය;

(iii) එම පාසල්වල හානි යථා තත්වයට පත්කිරීම සහ ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා මේ වනවිට රජය, අමාත්‍යාංශය, පළාත් සභා, විදේශ ආධාර වැඩසටහන් සහ අනෙකුත් ආයතන මඟින් ලබාදී ඇති මූල්‍ය ප්‍රතිපාදන;

(iv) එම මූල්‍ය ප්‍රතිපාදන මඟින් සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කරන ලද පාසල් සංඛ්‍යාව;

(v) මේ වනවිට සම්පූර්ණයෙන්ම අලුත්වැඩියා හෝ ප්‍රතිසංස්කරණය කර නොමැති පාසල් සංඛ්‍යාව;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අලුත්වැඩියා හෝ ප්‍රතිසංස්කරණය කර නොමැති පාසල් යථා තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය මුළු මුදල කොපමණද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

2344/2026

ගරු තුරෙරෙරාසා රවිකරන් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2021 වර්ෂයේ සිට 2026 වර්ෂයේ මේ දක්වා වූ කාලසීමාව තුළ ලියාපදිංචි කරන ලද ඩෙංගු රෝගීන් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය සහ වර්ෂය අනුව;

(ii) එම කාලසීමාව තුළ ඩෙංගු රෝගයෙන් මියගිය සංඛ්‍යාව, දිස්ත්‍රික්කය සහ වර්ෂය අනුව;

(iii) 2026 වර්ෂයේ මේ දක්වා ලියාපදිංචි කරන ලද ඩෙංගු රෝගීන් සංඛ්‍යාව සහ මියගිය සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය, මාසය, වයස් කාණ්ඩය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ඩෙංගු රෝගීන් වැඩි වශයෙන් වාර්තා වන දිස්ත්‍රික්ක සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාස කවරේද;

(ii) 2025 සහ 2026 යන වර්ෂවලදී ඩෙංගු රෝගය පාලනය කිරීම සඳහා ජාතික, පළාත්, දිස්ත්‍රික් සහ පළාත් පාලන ආයතන මට්ටමින් රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම ක්‍රියාමාර්ග සඳහා එක් එක් වර්ෂයේ වෙන් කළ සහ වැය කළ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

2355/2026

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම, මුලතිව් සහ වවුනියාව යන දිස්ත්‍රික්කවල පිහිටි ප්‍රාදේශීය මූලික රෝහල්වල අනුමත කාර්ය මණ්ඩලය, මේ වනවිට සේවයේ නියුතු කාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු ඇති තනතුරු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම රෝහල් අතරින් ගිලන්රථ පහසුකම් නොමැති හෝ ප්‍රමාණවත් ගිලන්රථ පහසුකම් නොමැති රෝහල් කවරේද;

(iii) එම රෝහල් සඳහා ගිලන්රථ ලබා දීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i)හි සඳහන් දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වන සිද්ධ වෛද්‍ය රෝහල්වල සේවය කරන වෛද්‍යවරුන්, ප්‍රජා සෞඛ්‍ය වෛද්‍යවරුන් සහ අනෙකුත් කාර්ය මණ්ඩල සංඛ්‍යාව රෝහල අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම රෝහල් අතරින් නේවාසික පහසුකම් සහිත රෝහල් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ අනුමත කාර්ය මණ්ඩලය සම්පූර්ණයෙන් පුරවා තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මන්නාරම සිලාවතුර රෝහල සහ ඉරණඉලුප්පෙයිකුලම් ප්‍රාථමික සෞඛ්‍ය රෝහල උත්ශ්‍රේණිගත කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ඉල්ලීම් පිළිබඳව දන්නේද;

(ii) එසේ නම්, උත්ශ්‍රේණිගත කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) එම රෝහල් උත්ශ්‍රේණිගත කිරීමට අපේක්ෂිත කාලරාමුව කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?